# 12 සාවුල් ශුද්ධාත්ම බලයෙන් එඩිතර මෙහෙවරක

ක්‍රියා 9 : 19-25

මුල් කිතුනු සභාවට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වූ ආකාරයත්, එහි ප්‍රතිඵලයක් ලෙස වේදසාක්ෂික ස්තේපන් ගල්ගසා මරණයට පත් කරන ලද ආකාරයත් අප පෙර පාඩමෙන් විමසා බැලීමු.

දේව කැඳවීම මහිමාන්විත ය. ඒ සඳහා වන ශුද්ධාත්ම දිරිගැන්වීම විස්මිත ය. යම් කෙනෙකු වෙත දේව කැඳවීම දෙනු ලබන්නේ ද, ඔහු හෝ ඇය නැතහොත් එම සමූහයා ශුද්ධාත්ම දිරියෙන් හා සවියෙන් පූර්ණ කරනු ලබන්නේ ය. මෙලෙස සභාව දිනපතා ශුද්ධාත්මයාණන් තුළ යාච්ඤාවෙන් බල ගැන්වී වර්ධනය වන්නට විය. එලෙසින් ම කිතුනු සභාවට ජුදෙව් ආගමෙන් ඇති වූ බාධක හා අභියෝග දිනපතා තවතවත් උග්‍ර වන්නට විය.
ඔවුහු කිතුනු ප්‍රේරිතයන් පීඩාවට පත් කළහ.
ප්‍රේරිතයන් මන්ත්‍රණ සභාව වෙත ගෙන ගියහ.
ඔවුන් අල්ලා පොදු හිරගෙයි දැමූහ.
කිතුනු ප්‍රේරිතයන්ට ගල් ගසා මරා දැමූහ.
සභාව වැනසීමට උත්සාහ දැරූහ.

මෙලෙස කිතුනු සභාව වැනසීමේ ව්‍යාපාරයට වඩාත් අනුගත ව හා කැපවීමෙන් කටයුතු කළ විශේෂ ජුදෙව්වෙකු පිළිබඳ ව ක්‍රියා පොතෙහි සඳහන් වේ. ඒ සාවුල් නම් ජුදෙව් මතධාරී පරිසිවරයා ය.

ස්තේපන්ට ගල් ගැසූ තරුණයන්ගේ ඇඳුම් රැකබලා ගැනීමේ වගකීම දැරූ පුද්ගලයා වූයේ ද මොහු ය. (ක්‍රියා 7:5) කිතුනු ගෙවල්වලට කඩාපැන කිතුනු පුරුෂයන් හා ස්ත්‍රීන් අත් අඩංගුවට ගැනීමට නායකත්වය දෙනු ලැබුවේ ද මොහු ය. (ක්‍රියා 8:3)

ඒ සඳහා දිනක් ඔහු දමස්කයට යන අතරතුර දී,

- ★ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ඔහුට සම්මුඛ විය.
- ★ උන්වහන්සේගේ හඬ ඔහුට ඇසිණි.
- ★ උන්වහන්සේගේ ආලේපනය ඔහු අත් දැක්කේ ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- කළ යුතු දේ පිළිබඳ ව ඔහු දේව උපදෙස් ලැබුවේ ය.
- ඔහුට නව ජීවිතයකට මඟ පැදිණි.
- ඔහු ශුද්ධාත්ම දිරියෙන් හා සවියෙන් බල ගන්වනු ලැබී ය.
- ඉන් අනතුරුව ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය ක්‍රියාත්මක වීම සඳහා ඔහු මග සැදුවේ ය.

මෙතෙක් කිතුනු සභාවේ පීඩකයා ලෙස නම් දරා සිටි සාවුල් දමස්කයේ දී නව ජීවිත අත්දැකීමකට මුහුණ දුන් පසු කිතුනු සභා ශ්‍රාවකයන් වෙත යෑමට ඔහුට හැකි විය. ඔවුන් තමා කෙසේ පිළිගනී ද? තමාගේ පෙර ජීවිතය ඔවුන් හා එක් වීමට බාධකයක් වේ ද? යන අභියෝග ජයගෙන දේව ක්‍රියාකාරීත්වයට නතු වීමට ශුද්ධාත්ම දිරිය තුළ සාවුල්ට හැකි විය. ශුද්ධාත්ම බලයෙන් දිරිමත් වන විට, දෙවියන් වහන්සේගේ කැමැත්තට අනුකූල වන ලෙස උන්වහන්සේ අන් අයගේ සිතිවිලි පවා වෙනස් කොට, දේව මෙහෙවරට මඟ සාදන බව මින් පැහැදිලි වේ.

ඉහත සඳහන් කළ පරිදි දමස්කයේ ධර්මශාලාවල දේශනා කිරීම සඳහා යොමුවීම, සාවුල් ශුද්ධාත්ම දිරිය තුළ බලගැන්වුණු බවට ප්‍රථම සාක්ෂිය වේ. සාවුල් නොබිය ව, නිර්භීත ව ධර්මශාලාවලට යමින් ***ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව ප්‍රකාශ කළේ ය.*** තව තවත් බලසම්පන්න ව ***ඒ ජේසුස් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ ම යැයි සනාථ කරමින් දේශනා කළේ ය.***

මෙලෙස ශුද්ධාත්ම දිරිය හා සවිය ලැබූ කල;

- හදවතින් ම ජේසුස් වහන්සේ පිළිගැනීමට
- දෙවියන් වහන්සේ තුළ එඩිතර වීමට
- විශ්වාසයෙන් දෙවියන් වහන්සේ තුළ සාක්ෂි දැරීමට
- දේව ක්‍රියාකාරීත්වය පිළිබඳ ව අන්‍යයන් ඇදහිල්ලෙන් ශක්තිමත් කිරීමට අපට හැකියාව ලැබේ.

සාවුල් තමා අත්දුටු සත්‍යතා නොබිය ව එළිදක්වමින් ශුද්ධාත්ම දිරිය හා සවිය තුළ ක්‍රියාකරන විට ඔහුට ජීවිත අභියෝගවලට මුහුණ දීමට සිදු වූ බව පැහැදිලි වේ.

කලක් ගත වූ පසු ජුදෙව්වරු ඔහු මැරීමට කුමන්ත්‍රණ කළ නමුත් ශුද්ධාත්ම රැකවරණය දිරිය හා සවිය ඔහුට නොඅඩු ව ලැබිණ. මෙහි දී ඔහුගේ ශ්‍රාවකයෝ සාවුල්ගේ දිවි රැක ගැනීමට කටයුතු කළහ.

අප දේව මඟපෙන්වීම ලැබ දේව කැඳවීමට යටත් වන විට, එහි දී මුහුණ දීමට සිදුවන අභියෝග ජයගැනීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ දිරිය හා සවිය අප වෙත ගෙන දෙන සේක.

එමෙන් ම එම අභියෝගවල දී උපකාර කිරීම සඳහා බොහෝ අය යොමු කරවන සේක.

**ක්‍රියාකාරකම**

1. සාවුල් වැනි පුද්ගලයෙකු දේව මෙහෙවර උදෙසා කැඳවීම තුළ ඔබගේ කිතුනු දිවියට කවර අත්දැකීම් එකතු කරගනු හැකි වන්නේ ද?